AL/2010/41-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**41 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

බුද්ධ ධර්මය I
பௌத்தம் I
**Buddhism I**

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

විභාග අංකය: ....................................

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** යුක්ත වේ.
* I කොටසට අනිවාර්ය ප්‍රශ්න 20 ක් ද II කොටසට ප්‍රශ්න 09 ක් ද ඇතුළත් වේ. I කොටසේ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ම සැපයිය යුතු ය. II කොටසින් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
* පිළිතුරු සැපයීම අවසානයේ දී I කොටසට අදාළ පිළිතුරු පත්‍රය II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ **එකට අමුණා** භාර දෙන්න.

## I කොටස

(ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.)

- නිවැරදි පිළිතුර තෝරා, **එහි අංකය, ඉදිරියෙහි ඇති වරහන තුළ** ලියන්න.

1. 1.1 අශාශ්වත දෘෂ්ටිය හේතුවෙන් මිනිසුන් යොමුවන්නේ,
   (1) සීලබ්බතපරාමාසයටයි.
   (2) අත්තකිලමථානුයෝගයටයි.
   (3) සයංකතවාදයටයි.
   (4) කාමසුඛල්ලිකානුයෝගයටයි.
   (5) සේඛපටිපදවටයි. (.........)

1.2 ලෝකවිදූ බුදුගුණයෙන් ප්‍රකාශ **නො වන්නේ,**
   (1) "ඛන්ධායතන ධාතුන්ගේ යථාර්ථය දන්නා" යන්න ය.
   (2) "බිඳෙනසුලු සියල්ල පිළිබඳ සත්‍යය අවබෝධ කළ" යන්න ය.
   (3) "ලෝකයේ සියලු විද්‍යාවන් ඉක්මවා ගිය" යන්න ය.
   (4) "කාම, රූප, අරූප ලෝක ස්වභාවය සකස් කළ" යන්න ය.
   (5) "සත්ත්ව, සංඛාර, ඕකාස ලෝක දැන දැකගත්" යන්න ය. (.........)

1.3 ධර්මකායෙහි ස්වභාවය කියැවෙන ප්‍රකාශය නම්,
   (1) "එය හුදෙක් ලෝකානුවර්තනය සඳහා ය" යන්නයි.
   (2) "වචනයෙන් එය විස්තර කිරීම පහසු ය" යන්නයි.
   (3) "එය සියලු තන්හි නොපවතී" යන්නයි.
   (4) "කිසිවකුටත් එය දැකගත නොහැකි ය" යන්නයි.
   (5) "සම්භෝග කාය හා නිර්මාණ කාය, ධර්ම කාය ආධාර කොට පවතී" යන්නයි. (.........)

1.4 කර්මය පිළිබඳ ව විමසා බණ අසා පැහැදී බුදුරදුන් වර්ණනා කෙළේ,
   (1) සච්චක පඬිවරයා ය.
   (2) උපාලි ගෘහපතිවරයා ය.
   (3) සුනක්ඛත්ත භික්ෂුව ය.
   (4) අජාසත් මහරජතුමා ය.
   (5) දීඝතපස්සි නිගණ්ඨයා ය. (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

1.5 බුදු දහම උපනිෂද්හි පුනරුක්තියක් **නො වන්නේ,**
(1) උපනිෂද් දහම නියත මිථ්‍යාදෘෂ්ටියක් වන බැවිනි.
(2) එම දහම භාරතීය දර්ශනයෙහි නොදියුණු ම යුගයට අයත් බැවිනි.
(3) බුදු දහමට පසුව උපනිෂද් දහම උපන් බැවිනි.
(4) උපනිෂද්හි ආත්මන් හා බ්‍රහ්මන් සංකල්පය මූලික බැවිනි.
(5) එම මුනිවරුන් සීල භාවනාදිය සපුරා බැහැර කළ බැවිනි. (.........)

1.6 "ධම්මා" යන්නට පර්යාය පදයක් වන්නේ,
(1) කම්ම ය. (2) පඤ්ඤ ය. (3) සබ්බ ය.
(4) පටිපද ය. (5) කුසල ය. (.........)

1.7 බුදු දහමෙහි මූලික ලක්ෂණයක් ලෙස හැඳින්විය හැක්කේ,
(1) අත්තංතප යෝගය පිළිගැනීම ය. (2) ද්වයවාදී වීම ය.
(3) සියල්ල මරණයෙන් අවසන්වේයයි ඉගැන්වීම ය. (4) සියලු අන්තවාද බැහැර කිරීම ය.
(5) සයංකතවාදී වීම ය. (.........)

1.8 ඊශ්වර නිර්මාණවාදය විවේචනය වන බුද්ධ දේශනාව නම්,
(1) දම්සක්පැවතුම් සූත්‍රයයි. (2) තේවිජ්ජ සූත්‍රයයි.
(3) චූලගොසිඞ්ග සූත්‍රයයි. (4) විභංගප්පකරණයයි.
(5) චූල්ලවග්ග පාළියයි. (.........)

1.9 පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **නිවැරදි** වන්නේ,
(1) බමුණෝ සිල්වත්කම අගය කරති. (2) සියලු ශ්‍රමණයෝ කර්ම විපාක බැහැර කරති.
(3) ආජීවකයෝ ජෛන සම්ප්‍රදායට අයත් වෙති. (4) අභයරාජ කුමරු උච්ඡේදවාදියෙකි.
(5) වෛදික චින්තකයෝ අනීශ්වරවාදී වෙති. (.........)

1.10 නවලෝකෝත්තර ධර්මවලට ඇතුළත් වන්නේ,
(1) අව්‍යාකෘත ධර්මයි. (2) සකදාගාමී මාර්ගයයි.
(3) සත්ත බොජ්ඣංගයි. (4) බුද්ධත්වයයි.
(5) සතර පරමාර්ථ ධර්මයි. (.........)

1.11 බෞද්ධ පැවිද්ද අර්ථවත් වන ධර්ම පාඨයක් **නො වන්නේ,**
(1) "සන්තුට්ඨො හොති කාය පරිහාරෙන චීවරෙන" යන්නයි.
(2) "අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී" යන්නයි.
(3) "කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං" යන්නයි.
(4) "ධම්මානුධම්මපටිපන්නො විහරති" යන්නයි.
(5) "ගොපොව ගාවො ගණයං පරෙසං" යන්නයි. (.........)

1.12 සාංඝික දේපළ ක්‍රමයේ ලක්ෂණයක් ලෙස සැලකිය හැක්කේ,
(1) සාමණේර භික්ෂූන් විසින් රැක බලා ගැනීම ය. (2) විහාරාධිපති හිමිවරුන්ට අයත් වීම ය.
(3) සාමූහික වගකීම ය. (4) රජය විසින් පරිපාලනය කිරීම ය.
(5) දායක සභාවේ පාලනයට යටත් වීම ය. (.........)

1.13 පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **නිවැරදි** වන්නේ,
(1) ආචාර්යවරයා උපාධ්‍යායවරයාට යටත් ය.
(2) අන්තේවාසිකයාගේ ශිෂ්‍යයා සද්ධිවිහාරිකයා ය.
(3) ආචාර්යවරයා හා අන්තේවාසිකයා අතර බැඳීමක් නොමැති ය.
(4) සද්ධිවිහාරිකයා ආචාර්යවරයාගේ අවවාද නොපිළිගත යුතු ය.
(5) උපාධ්‍යායවරයාගේ ශිෂ්‍යයා සද්ධිවිහාරිකයා ය. (.........)

1.14 බුද්ධශ්‍රාවකයන්ට තනතුරු ලබාදීම ගැන සඳහන් වන්නේ,
(1) මහාවග්ග පාළියේ ය. (2) විභඞ්ගට්ඨකථාවේ ය.
(3) එතදග්ග පාළියේ ය. (4) විසුද්ධිමග්ගයේ ය.
(5) නෙත්තිප්පකරණයේ ය. (.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

1.15 සතරමහාපදේසවලට අයත් **නො වන්නේ**,

(1) බුද්ධාපදේස ය.
(2) එකත්ථෙරාපදේස ය.
(3) ධම්මාපදේස ය.
(4) සම්බහුලථෙරාපදේස ය.
(5) සංඝාපදේස ය.
(.........)

1.16 භාණකවරුන් පත්කිරීම ආරම්භ වන්නේ,

(1) ප්‍රථම සංගීතියේ සිට ම ය.
(2) විනය නීති පැනවීමෙන් පසුව ය.
(3) පොළොන්නරු රාජධානි සමයේ ය.
(4) භික්ෂූන් බණ කීමට පටන්ගත් පසුව ය.
(5) බුද්ධ නියමය අනුව ම ය.
(.........)

1.17 **A** තීරුවේ සඳහන් එක් එක් පදයේ අර්ථයට ගැළපෙන යෙදුම **B** තීරුවෙන් සොයා, එයට හිමි අකුර **A** තීරුවේ **වරහන තුළ** ලියන්න.

| **A තීරුව** | | **B තීරුව** |
|---|---|---|
| (1) සම්පරායික | (.........) | (අ) මනා අවබෝධය |
| (2) පච්චුප්පන්න | (.........) | (ආ) සැක කරන |
| (3) පුබ්බන්තකප්පික | (.........) | (ඉ) පරලොව |
| (4) පරිසංඛාය | (.........) | (ඊ) වර්තමාන |
| (5) පටිභාන | (.........) | (උ) පෙර ආත්මය සොයන |

1.18 කථාවත්ථුප්පකරණය,

(1) බණ කථා දහසක් ඇතුළත් ග්‍රන්ථයකි.
(2) මහාකාශ්‍යප හිමියන් විසින් රචිත ය.
(3) දෙවැනි ධර්මසංගීතියේ තොරතුරු සඳහන් මූලාශ්‍රයයි.
(4) මජ්ඣිමනිකායට ඇතුළත් ය.
(5) ථෙරවාද මත ඉස්මතු කරන, වෙනත් නිකායික මත බැහැර කරන කෘතියකි. (.........)

1.19 ආණා දේශනා යනු,

(1) සූත්‍ර දේශනායි.
(2) විනය පිටකයයි.
(3) ධම්මසංගනිප්පකරණයයි.
(4) ආනන්ද හිමියන්ගේ ධර්මදේශනාවයි.
(5) භික්ෂූන්ට කළ අණකිරීමයි.
(.........)

1.20 ඛුද්දකනිකායට ඇතුළත් වන්නේ,

(1) කෝසල සංයුත්තයයි.
(2) මූලමධ්‍යමක කාරිකාවයි.
(3) උදාන පාළියයි.
(4) විභංගප්පකරණයයි.
(5) මහාවග්ග පාළියයි.
(.........)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**41 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

බුද්ධ ධර්මය I
பௌத்தம் I
**Buddhism I**

* ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## II කොටස

2. (අ) බුදුරදුන්ගේ ස්වාභාවික මිනිස් අත්දැකීම් විස්තර කරන්න.
   (ආ) "බුදුරජාණන් වහන්සේ උත්තරීතර මනුෂ්‍යයෙකි." විමසන්න.

3. (අ) බුදුරදුන් වෙත පැවැති සුවිශේෂ ඤාණාධිගම **දෙකක්** පැහැදිලි කරන්න.
   (ආ) බුදුබව හා රහත්බව අතර ඇති සමානතා පෙන්වා දෙන්න.

4. (අ) භෞතිකවාදය යනු කුමක්දැ'යි විමර්ශනය කරන්න.
   (ආ) එම වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය පරීක්ෂා කරන්න.

5. (අ) "බුද්ධ ධර්මය දේව අනාවරණයක් නො වේ" සාකච්ඡා කරන්න.
   (ආ) "ධම්මො පච්චත්තං වෙදිතබ්බො" යන්නෙහි අරුත් පැහැදිලි කරන්න.

6. (අ) "ප්‍රාග් බෞද්ධ පබ්බජ්ජා" සංකල්පය විස්තර කරන්න.
   (ආ) බෞද්ධ පැවිද්දේ විශේෂ ලක්ෂණ පෙන්වා දෙන්න.

7. (අ) විනයකර්මයක් යනු කුමක්දැ'යි පහදන්න.
   (ආ) විනයකර්මයක ඇති ප්‍රජාතාන්ත්‍රීය ලක්ෂණ පරීක්ෂා කරන්න.

8. (අ) තෙවන ධර්ම සංගායනාවට තුඩුදුන් ශාසනික පසුබිම පැහැදිලි කරන්න.
   (ආ) ශාසන චිරස්ථිතියට එම සංගායනාවෙන් සිදු වූ මෙහෙවර අගයන්න.

9. (අ) අභිධර්ම පිටකයට අයත් සත්තප්පකරණ හඳුන්වා දෙන්න.
   (ආ) "සූත්‍ර ධර්මයට අතිරේක වූ විශේෂ ධර්මය අභිධර්මයයි." විමසන්න.

10. (අ) "සුත්ත" යන්නෙහි අර්ථ විභාග කරන්න.
    (ආ) සූත්‍ර පිටකය සම්මුති දේශනාවක් ලෙස හැඳින්වෙන්නේ ඇයි? පැහැදිලි කරන්න.

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

2645

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**41 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

බුද්ධ ධර්මය II
பௌத்தம் II
**Buddhism II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

විභාග අංකය: ....................................

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** යුක්ත වේ.
- I කොටසට අනිවාර්ය ප්‍රශ්න **20** ක් ද II කොටසට ප්‍රශ්න **09** ක් ද ඇතුළත් වේ. I කොටසේ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ම සැපයිය යුතු ය. II කොටසින් ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතුරු සැපයීම අවසානයේ දී I කොටසට අදළ පිළිතුරු පත්‍රය II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ **එකට අමුණා** භාර දෙන්න.

## I කොටස

(ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.)

- නිවැරදි පිළිතුර තෝරා, **එහි අංකය, ඉදිරියෙහි ඇති වරහන තුළ** ලියන්න.

1. 1.1 පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **නිවැරදි** වන්නේ,
   (1) "ආත්මවාදයේ පදනම උච්ඡේදවාදය" යන්නයි.
   (2) "උපනිෂද් දර්ශනය නිත්‍ය ආත්මය පිළිගනී" යන්නයි.
   (3) "ජෛනයෝ ආත්මවාදීහු නොවෙති" යන්නයි.
   (4) "භාරතීය ආත්ම සංකල්පයේ විවිධ ස්වරූප නැත" යන්නයි.
   (5) "බ්‍රාහ්මණ සම්ප්‍රදය ආත්මවාදයයි" යන්නයි. (.........)

   1.2 අග්ගඤ්ඤ සූත්‍රය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ,
   (1) "එහි භෞතික පරිසරය ගැන අවධානය යොමු කර ඇත" යන්නයි.
   (2) "ඒ අනුව සමාජ පරිණාමයට තුඩුදුන් මිනිස් හැසිරීම් ද පැහැදිලි කෙරේ" යන්නයි.
   (3) "එම සූත්‍රය රාජ්‍යයේ ප්‍රභවය ද පැහැදිලි කරයි" යන්නයි.
   (4) "එහි මිනිස් සිත පිළිබඳ කිසිවක් සඳහන් නො වේ" යන්නයි.
   (5) "එය වෘත්තාන්ත ශෛලියෙන් කළ දේශනාවකි" යන්නයි. (.........)

   1.3 බුදු දහම අනුව විඤ්ඤාණය,
   (1) අරමුණු දැනගැනීම ලක්ෂණ කොට ඇත.
   (2) මිනිස් සිතෙහි ඉහළ ම දියුණුවයි.
   (3) ඇති තතු දැක්මට උපකාරී වෙයි.
   (4) ත්‍රිලක්ෂණයට යටත් නො වේ.
   (5) නාම ධර්මයක් ලෙස හැඳින්වීම වරදකි. (.........)

   1.4 ගිහි පැවිදි සම්බන්ධය තහවුරු කෙරෙන කරුණක් **නො වන්නේ,**
   (1) පැවිද්දන් විසින් ගිහියන් යහපත් ක්‍රියාවල යෙදවීම ය.
   (2) ගිහියන් විසින් පැවිද්දන්ට මෛත්‍රියෙන් ක්‍රියා කිරීම ය.
   (3) ගිහි පැවිදි දෙපක්ෂය ම සමානාත්මතාවෙන් කටයුතු කිරීම ය.
   (4) ගිහියන්ට පැවිද්දන් විසින් අනුකම්පා කරනු ලැබීම ය.
   (5) නිවසට පැමිණෙන පැවිද්දන් ගිහියන් විසින් සතුටින් පිළිගැනීම ය. (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

1.5 සසර දුක පිළිබඳ බුද්ධ දේශනාවක් **නො වන්නේ,**
(1) "සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා" යන්නයි.
(2) "දුක්ඛෙ ලොකො පතිට්ඨිතො" යන්නයි.
(3) "අධිච්චසමුප්පන්නං සුඛදුක්ඛං" යන්නයි.
(4) "යංකිඤ්චි වෙදයිතං සබ්බන්තං දුක්ඛස්මිංති වදමි" යන්නයි.
(5) "දුක්ඛමෙව උප්පජ්ජමානො උප්පජ්ජති" යන්නයි. (.........)

1.6 දුක්ඛ නිරෝධාර්ය සත්‍යය හැඳින්වෙන ව්‍යවහාරයක් වන්නේ,
(1) "අසංඛත" යන්නයි. (2) "උපාදාන" යන්නයි.
(3) "පපඤ්ච" යන්නයි. (4) "ජාත" යන්නයි.
(5) "විභව" යන්නයි. (.........)

1.7 ඉන්ද්‍රිය ඤාණය විවරණය වන බුද්ධ දේශනාවක් වන්නේ,
(1) කථාවත්ථුප්පකරණයයි. (2) මහාවග්ග පාළියයි.
(3) මිලින්දපඤ්හයයි. (4) සිගාලෝවාද සූත්‍රයයි.
(5) මධුපිණ්ඩික සූත්‍රයයි. (.........)

1.8 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිවැරදි** වන්නේ,
(1) "පටිච්චසමුප්පාදය හා චතුරාර්යසත්‍යය අතර සම්බන්ධයක් නැත" යන්නයි.
(2) "නිවන පටිච්චසමුප්පන්න ධර්මයක් නො වේ" යන්නයි.
(3) "පටිච්චසමුප්පාදයේ මුල අවිද්‍යාව ය" යන්නයි.
(4) "ප්‍රතිලෝම පටිච්චසමුප්පාදය පැවැත්ම පැහැදිලි කරයි" යන්නයි.
(5) "පටිච්චසමුප්පාදයෙහි නොයෙක් අරමුණු නැත" යන්නයි. (.........)

1.9 "භවදිට්ඨි" යනු,
(1) උච්ඡේදවාදයයි. (2) පකුධකච්චායනගේ ඉගැන්වීමයි.
(3) 'සබ්බං නත්ථි' යන්නයි. (4) ශාශ්වත දෘෂ්ටියයි.
(5) භවයෙහි යථාර්ථය දැකීමයි. (.........)

1.10 පුද්ගල ශක්තිය ප්‍රකාශ **නො වන** පදයකි.
(1) පධාන (2) වායාම
(3) පුරිසකාර (4) පරායන
(5) නික්ඛමධාතු (.........)

1.11 පඤ්චඅභිඤ්ඤාවන්ට ඇතුළත් **නො වන්නේ,**
(1) ඉන්ද්‍රිය ඤාණයයි. (2) චුතූපපාත ඤාණයයි.
(3) චතුර්ථ ධ්‍යානයයි. (4) නිරෝධ සමාපත්තියයි.
(5) ආසවක්ඛය ඤාණයයි. (.........)

1.12 බුදුරදුන් විසින් සතිපට්ඨාන සූත්‍රය දේශනා කෙළේ,
(1) සැවැත්නුවර දී ය. (2) සංකස්සපුරයේ දී ය.
(3) කම්මාසදම්ම නිගමයේ දී ය. (4) පැලලුප්නුවර දී ය.
(5) ගිජ්ඣකූළපව්වේ දී ය. (.........)

1.13 කර්මවිපාක පිළිබඳ බෞද්ධ ඉගැන්වීමක් **නො වන්නේ,**
(1) "සබ්බ කම්මානං අකිරියං ව්‍යාකාසි" යන්නයි.
(2) "කම්මනා වත්තතී ලොකො" යන්නයි.
(3) "කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතාය" යන්නයි.
(4) "කම්මස්සකා මානව සත්තා කම්මදායාද" යන්නයි.
(5) "විපාකා කම්ම සම්භවා" යන්නයි. (.........)

1.14 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිවැරදි** වන්නේ,
(1) "සද්ධා යනු පැහැදීම" යන්නයි. (2) "සද්ධා යනු භක්තිය" යන්නයි.
(3) "අමූලිකා සද්ධා නිවනට තුඩුදෙයි" යන්නයි. (4) "සද්ධාව පරමාර්ථ ධර්මයකි" යන්නයි.
(5) "සද්ධාව ඉන්ද්‍රියකි" යන්නයි. (.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

1.15 සීලය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම නම්,

(1) සිල් රැකීමෙන් නිවන් දැකිය හැකි ය.
(2) සීලය සමාධිය අපේක්ෂා නො කරයි.
(3) විරති සමාදාන දෙක ම සීලයට අයත් ය.
(4) බාහිර වශයෙන් සංවරවීම සීලයයි.
(5) සීලය වතක් මෙන් ආරක්ෂා කළ යුතු ය.

(.........)

1.16 බුදු දහමට අනුකූල වන්නේ,

(1) කුසලය ම පින ලෙස සලකා ගැනීම ය.
(2) පින සසරටයි කුසලය නිවනටයි.
(3) කුසල් හා පින් අතර කිසිත් සබඳතාවක් නැත.
(4) අකුසලය හා පව එකිනෙකට වෙනස් ය.
(5) රහතුන්ට ද පින් අවශ්‍ය වේ.

(.........)

1.17 "අපඤ්ඤත්තං න පඤ්ඤපෙන්ති පඤ්ඤත්තං න සමුච්ඡින්දන්ති" යන්න සඳහන් වන්නේ,

(1) දස සක්විතිවත්වල ය.
(2) සතර අගතිවල ය.
(3) දසරාජධර්මවල ය.
(4) සප්ත අපරිහානිය ධර්මවල ය.
(5) සතරසංග්‍රහවස්තුවල ය.

(.........)

1.18 පඤ්චබලි ගැන සඳහන් වන්නේ,

(1) පත්තකම්ම සූත්‍රයේ ය.
(2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ය.
(3) සිගාලෝවාද සූත්‍රයේ ය.
(4) අණණ සූත්‍රයේ ය.
(5) ද්විචක්ඛු සූත්‍රයේ ය.

(.........)

1.19 **A** තීරුවේ සඳහන් එක් එක් පදයේ අර්ථයට ගැළපෙන යෙදුම **B** තීරුවෙන් සොයා, එයට හිමි අකුර **A** තීරුවේ **වරහන තුළ** ලියන්න.

| **A තීරුව** | | **B තීරුව** |
|---|---|---|
| (1) පෙත්තිකවිනය | (.........) | (අ) කර්මානුරූප දුක |
| (2) කංඛාවිතරණ | (.........) | (ආ) අහේතුකව හටගත් |
| (3) අධිච්චසමුප්පන්න | (.........) | (ඉ) සැක දුරු කිරීම |
| (4) සතිසම්පජඤ්ඤ | (.........) | (ඊ) පිය උරුමය |
| (5) සංඛාර දුක්ඛ | (.........) | (උ) සිහි නුවණ |

1.20 පහත දැක්වෙන ප්‍රකාශවලින් **නිවැරදි** වන්නේ,

(1) "බුදු දහමෙහි දෙවිවරුන් ගැන කිසිවක් සඳහන් නො වේ" යන්නයි.
(2) "දේව විශ්වාස හා නිවන් මඟ අතර සම්බන්ධයක් නැත" යන්නයි.
(3) "බුදු දහම දේව විශ්වාසය සපුරා ප්‍රතික්ෂේප කරයි" යන්නයි.
(4) "හින්දු දෙවිවරුන් ගැන බෞද්ධ මූලාශ්‍රවල සඳහන් නො වේ" යන්නයි.
(5) "බුද්ධත්වය දේවත්වයට සමාන වේ" යන්නයි.

(.........)

* *

මෙතැනින් කපන්න

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**41 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

බුද්ධ ධර්මය II
பௌத்தம் II
**Buddhism II**

* ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## II කොටස

2. (අ) බුද්ධකාලීනව විසූ අශාශ්වතවාදීන්ගේ ඉගැන්වීම් විස්තර කරන්න.
   (ආ) අශාශ්වතවාදය පිළිබඳ බෞද්ධ ආකල්පය පරීක්ෂා කරන්න.

3. (අ) ස්වාභාවික පරිසරය හා බුදු සිරිත අතර ඇති සබඳතා පෙන්වා දෙන්න.
   (ආ) තුරුලතා සංරක්ෂණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරන්න.

4. (අ) දුක්ඛසමුදයාර්ය සත්‍යය පිළිබඳ ධර්මානුකූල විස්තරයක් කරන්න.
   (ආ) බුදු දහම සර්ව අසුභවාදයක් **නො වන්නේ** කුමන හේතු නිසාද'යි සාකච්ඡා කරන්න.

5. (අ) "පටිච්චසමුප්පාදය බුදු දහමෙහි පදනමයි" විමසන්න.
   (ආ) පටිලෝම පටිච්චසමුප්පාදය අනුව දුක්ඛ නිස්සරණය පැහැදිලි කරන්න.

6. (අ) ස්වච්ඡන්දතාව යනු කුමක් ද? විස්තර කරන්න.
   (ආ) පුද්ගල ස්වච්ඡන්දතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පැහැදිලි කරන්න.

7. (අ) "භාවනාව යනු කුසල් සිත් වැඩීම ය." විමසන්න.
   (ආ) මෙරට බෞද්ධයන් අතර භාවනාව ගැන ඇති වැරදි මත පෙන්වා දෙන්න.

8. (අ) "සද්ධාය තරතී ඔඝං" මේ පිළිබඳ විමසුමක් කරන්න.
   (ආ) අමූලිකා ශ්‍රද්ධාව හා ආකාරවතී ශ්‍රද්ධාව අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

9. (අ) ආර්ථික සංවර්ධනය හා සදාචාර සංවර්ධනය අතර ඇති සම්බන්ධය පෙන්වා දෙන්න.
   (ආ) රටක ආර්ථික සංවර්ධනයට අදාළ රාජ්‍යතාන්ත්‍රික වගකීම බුදු දහම අනුව පැහැදිලි කරන්න.

10. (අ) දේශපාලනය ගැන උනන්දුවීම බුදු දහමට අදාළ වන අයුරු පැහැදිලි කරන්න.
    (ආ) යුද්ධය, සාමය හා රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ආකල්පය පැහැදිලි කරන්න.

***